# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/67/2024 (PSC)**

ආර්.ඩබ්.එච්.ටී.කෞෂල්‍යා
**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2025.12.11**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ආර්.ඩබ්.ඩී.චතුරිකා මහත්මිය.

**-<u>නියෝගය</u>-**

මෙම අභියාචනයට අදාළව පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාචික දේශනවලට සහ ලිඛිත දේශනවලට අවධානය යොමු කරන ලදී. අභියාචක විසින් 2024.03.04 දින දරණ අභියාචනා පෙත්සම මඟින් දන්වා ඇත්තේ, ඇයට 2019.10.07 වන දින සිට සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බැවින් ඇයව සේවය අත්හැර ගියා සේ සළකමින් ක්‍රියා කර ඇති බවයි. ඇය පවසා ඇත්තේ, ඇය රිය අනතුරකට භාජනය වූ හෙයින් එසේ සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවයි. මේ අනුව පෙනී යන්නේ ඇයගේ සේවය නතර කර ඇත්තේ, 2019 වර්ෂයේදී බවයි. සේවය අතහැර ගියා සේ සළකමින් දන්වන ලද ලිපිය 2019 වසරේදී නිකුත් කර ඇතත්, ඇය විසින් නැවත සේවය ඉල්ලමින් කරන ලද ඉල්ලීම කර ඇත්තේ 2023 වර්ෂයේදී බව පෙනී යයි. ඒ අනුව ඇයගේ ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා වසර 4ක පමණ කාලයක ප්‍රමාදයක් සිදු වී ඇත. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සේවය අතහැර යාමේ නියෝගයක් ඉවත් කර ගැනීම සඳහා අවම වශයෙන් මාස හයක පමණ කාලයක් ඇතුළත එම

ඉල්ලීම ඉදිරිපත් කර තිබිය යුතුය. ඒ අනුව එම ඉල්ලීම සඳහා වර්ෂ 3කට වැඩි කාලයක් ගතවී තිබීම මෙහිදී සැලකිය යුතු බලවත් ප්‍රමාදයකි. එම කරුණ සලකා බලන විට අභියාචකගේ ඉල්ලීමට ඉඩ දීමට හැකියාවක් නැත.

මීට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2025.12.03 දිනැති වාර්තාවේ සඳහන් කර ඇත්තේ, සේවය අතහැරයාමේ නියෝගය නිකුත් කරන අවස්ථාව වන විට අභියාචකගේ සම්පූර්ණ සේවා කාලය මාස 4 දින 23 ක් පමණක් වන බවයි. ඇය පරිවාස කාලපරිච්ඡේදය තුළ සේවය කරමින් සිටින ලද නිළධාරිනියකි. එවැනි නිළධාරියකු විසින් සේවයට නොපැමිණීමට හේතු හැකි ඉක්මනින් දන්වා කටයුතු නොකිරීම බලවත් වරදකි. එම තත්ත්වය යටතේ එවැනි නිළධාරියකු වෙත නිකුත් කර ඇති සේවය අතහැරයාමේ නියෝගය ඉවත් කිරීම සඳහා නියෝගයක් නිකුත් කිරීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත. ඉහත කරුණු සළකා බලා මෙම අභියාචකගේ අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/